නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය

வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மீ ஓய

**Resident Project Management Office – Mee Oya**

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

මී ඔය
ගල්ගමුව
மீ ஓய
கல்கமுவ
Mee Oya
Galgamuwa

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref No | 2018/5/ 4 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref N | | දිනය<br>திகதி.<br>Date | 2019 /02 /26 |

**ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික රජයේ නිලධාරී මහතුන් හා සියළුම ගොවි සංවිධාන නියෝජිත වරුන් වෙත.**

**විශේෂ ව්‍යාපාර කමිටුව හා පෙර කන්න රැස්වීම් වාර්තාව හා**

**2019 පෙබරවාරි මාසය - උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය'**

**1994 අංක 13 දරණ සංශෝධන පණතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය යටතේ උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය වෙනුවෙන් 2019 යල කන්නය සඳහා පෙර වගා රැස්වීම 2019/02/26 දින 9.00 ට උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්වූ අතර එහිදී පළමුව ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණි සිටි සියළුම රජයේ නිලධාරී මහතුන් හා සියළුම ගොවි සංවිධාන නියෝජිත මහතුන් පිළිගැනීමෙන් පසුව න්‍යාය පත්‍රානුකූලව එදිනට නියමිත කටයුතු ආරම්භ කරන ලදී.**

**එදින සහභාගී වූවන්ගේ නාම ලේඛණය**

| අනු අංකය | නම | ආයතනය/ ගොවි සංවිධානය |
|---|---|---|
| 01 | D.M.H.K. දිසානායක | නේවාසික ව්‍යාපාර කළමනාකරු<br><br>මී-ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය |
| 02 | K.W නාරංගම්මන | වාරිමාරග ඉංජිනේරු - ප්‍රා.වා.ඉ. කාර්යාලය-ගල්ගමුව |
| 03 | S.H.L.N.ප්‍රේමචන්ද්‍ර | සංවර්ධන නිලධාරී- මී-ඔය/උස්ගල සියඹලන්ගමුව |
| 04 | D.M.S.C.B. දසනායක | කෘෂිකර්ම උපදේශක-උස්ගල සියඹලන්ගමුව |
| 05 | R'G'S'S'වීරසිංහ | කෘෂිකර්ම උපදේශක-උස්ගල සියඹලන්ගමුව |

| | | |
|---|---|---|
| 06 | P.M.සෝමසිරිරත්න | ඩී 01 - ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 07 | K.A.චන්ද්‍රපාල | ඩී 01 - ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 08 | T.M.ජයසේන | ඩී 01 - ගොවි සංවිධානය -ගරු භාණ්ඩාගාරික |
| 09 | B.M.ජයවර්ධන | ඩී 02 - ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 10 | A.H.ආරියරත්න | ඩී 02 - ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 11 | D.M.තිලකරත්න | ඩී 02 - ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික |
| 12 | H.M.සමන්ත හේරත් | ඩී 03 - ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 13 | R.M.රෝහිණී රාජපක්ෂ | ඩී 03 - ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 14 | N.G. අනුර | ඩී 04 - ගොවි සංවිධානය - ගරු සභාපති |
| 15 | H.M.නිශාන්ත හේරත් | ඩී 04 - ගොවි සංවිධානය - ගරු ලේකම |
| 16 | K.M.ගුණරත් බණ්ඩා | සාලියරාජ ගොවි සංවිධානය - ගරු සභාපති. |
| 17 | H.P.ප්‍රදීප් ප්‍රියන්ත | සාලියරාජ ගොවි සංවිධානය - ගරු ලේකම්. |
| 18 | S.P.තිලකරත්න | යාය 05 ගොවි සංවිධානය - ගරු ලේකම |
| 19 | A.M.චන්දන අතපත්තු | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 20 | R.P.D.ගුණසේකර | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 21 | K.A.රෙජිනා රෝස් | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 22 | I.H.ධර්මසිරි | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 23 | K.G.රණවීර | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 24 | L.R.ජයසිංහ | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 25 | I.M.සුමනාවතී මැණිකේ | යාය 05 ගොවි සංවිධානය - ගරු නියෝජිත |
| 26 | R.D.හංස කුමාර | උස්ගල - මිරිදිය ධීවර සංවිධානය - ගරු සභාපති |

**01පසුගිය වාර්තාව සමාලෝචනය**

වාර්තාවේ ගැටලු කිසිවක් නොමැති වූ හෙයින් කමටුවේ කටයුතු ඉදිරියට කරගෙන යන ලදි.

**02.ආයතන සංවර්ධන කටයුතු (සංවර්ධන නිලධාරී)**

| අනු අංකය | ගොවි සංවිධානය | 2019 ජනවාරි මාසය | |
|---|---|---|---|
| | | ගිණුම් යථාවත් කිරීම | මාසික රැස්වීම් පැවැත්වීම |

| | | | |
|---|---|---|---|
| 01 | ඕ 01 | √ | √ |
| 02 | ඕ 02 | √ | √ |
| 03 | ඕ 03 | √ | √ |
| 04 | ඕ 04 | √ | √ |
| 05 | සාලියරාජ | √ | √ |
| 06 | යාය 05 | √ | √ |

2019 පෙබරවාරි 22 - යාය 05 ගොවි සංවිධානයේ ද 25 - ඕ 03 ගොවි සංවිධානයේ ද මහ සභා රැස්වීම් පවත්වා ඇත.

ගොවි සංවිධාන භාණ්ඩාගාරික වරුන් සතු අත ඉතිරි මුදල් මේ වන විට සැලකිය හැකි මට්ටම දක්වා පහළ බැස ඇති අතර තව දුරටත් මෙම අත ඉතිරි මුදල් නොරඳවාගෙන බැංකු ගත කරන ලෙස දැන්වී ය. අවශ්‍ය වියදම් සඳහා කාරක සභාවේ අනුමැතිය මත නැවත මුදල් නිදහස් කර ගන්නා ලෙස උපදෙස් දුණි.

| අනු අංකය | ගොවි සංවිධානය | නිලවරණය පැවැත්විය යුතු දිනය |
|---|---|---|
| 01 | ඕ 01 | 2019/05/21 |
| 02 | ඕ 02 | 2019/05/29 |
| 03 | ඕ 03 | 2019/07/27 |
| 04 | ඕ 04 | 2019/06/18 |
| 05 | සාලියරාජ | 2020/07/23 |
| 06 | යාය 05 | 2019/08/13 |

2.2. රාජ්‍ය විගණනය

ඉදිරි මාර්තු මාසය අවසන් වන විට ගොවි සංවිධාන සියල්ල විගණනය කර අවසන් කළ යුතු බැවින් එම කටයුතු කඩිනම් කරන ලෙස දැන්වීය

වාරි පුබුදු ණය යෝජනා ක්‍රමය යටතේ දැනට ණය ලබගෙන ඇති පුද්ගලයින් පිළිබඳව හා ඔවුන්ගේ හිග වාරික මුදල් පිළිබඳව විස්තර කාර්යාලයට එවා ඇති අතර මේ පිළිබඳව සොයා බලා එහි තත්වය වාර්තා කළ යුතුව ඇත. එම නිසා මෙම පුදලගයින් පිළිබඳව පරීක්ෂණය කිරීමට ගොවි සංවිධාන සභය අවශ්‍ය බව දැනුම් දුණි.

**PEISEIP ව්‍යාපෘතියේ ප්‍රගතිය**

මේ වන විට යාය 05 ගොවි සංවිධානයේ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කර ඇති අතර ඊළග පියවර ලෙස ඕ 04 හා ඕ 03 ගොවි සංවිධානයන්හි අදාල කටයුතු ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

**02.2018/19 මහ කන්නයේ සමාලෝචනය ( නේවාසික ව්‍යාපාර කළමණාකරු - මී ඔය / උස්ගල ව්‍යාපාරය )**

පසුගිය කන්නය ව්‍යාපාරය තුළ සමස්ථ කුඹුරු වගා කිරීමට ගොවීන් හට මහගු අවස්ථාවක් ලැබුණු අතර මේ වන මිට අස්වනු නෙළීමේ කටයුතු ආසන්නයට වගාව පැමිණ ඇති බව සඳහන් කරන ලදි

ඇතැම් ස්ථාන වලින් දැනටද කීඩෑ හානිය වාර්තා වන නිසා ජලය අවශ්‍ය පමණට පමණක් වගාවට ලබා දී හැකි පමණ වගාව වියළි තත්වයේ පවත්වා ගනිමින් එම උවදුර වලක්වා ගැනීමට කටයුතු කරන ලෙෂ උපදෙස් දුන්නේ ය

ඉදිරි යල් කන්නය හැකි ඉක්මණින් ආරම්භ කර නියමිත දින වකවානු වලට වගා කටයුතු අවසන් කළහොත් අමතර ආදායමක් ලබා ගැනීම සඳහා ගොවීන් හට අතරමැදි කන්නයක් කරා වුවද යාමට අවස්ථාව පවතින බව පැහැදිළි කර දුණි.

02.1. වාරිමාර්ග කටයුතු ( වාරිමාර්ග ඉංජිනේරු - ගල්ගමුව)

උස්ගල ව්‍යාපාරයේ දැනට අස්වනු නෙළීමේ කටයුතු ආරම්භ වී තිබෙන අතර මෙම කටයුතු අවසන් වීම සඳහා තවත් දින කිහිපයත් ගත වනු ඇත. දැනටත් ජලාශය වාන් මට්ටමේ පවතින නිසා ඉදිරි යල් කන්නය සම්පූර්ණයෙන්ම වගා කිරීමට හැකියාව පවතී.

අස්වනු නෙළීමේ කටයුතු ආරම්භ වුවද තවත් එක් ජල මුරයක් ඉල්ලා සිටින ගොවීන් කිහිප දෙනෙකු ව්‍යාපාරයේ සිටන අතර මෙම ඉල්ලීම ගොවි සංවිධාන මට්ටමින් ද කර ඇත. මෙසේ වීමට හේතුව වන්නේ ව්‍යාපාරයේ ගොවීන් සියලු දෙනා එකවර වගා නොකිරීම බව දැක්වී ය.

කෙසේ වෙතත් ඉතා සුදුසු වන්නේ අස්වනු නෙළීම අවසන් වූ වහාම ජලය නිකුත් කිරීම බව ප්‍රකාශ කරන ලදි.

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසදුම | වගකීම | විසදුම අපේක්ෂා කරන කාලය |
|---|---|---|---|---|
| ඩී 04 ගරු සභාපති | ඇතැම් කෙත් ඇළවල් වල කුඹුරු බට කැඩී ජලය පිටාර යාම | කුඹුරු බට ප්‍රතිසංස්කරණය කිරීම | වා.ඉ. /ඉ.ස | ස්ථානීය පරීක්ෂණයකින් අනතුරුව |
| එම | ජල පාලන ගේට්ටු කැඩී ජල පාලනය අපහසු වීම | ජල පාලන ගේට්ටු ප්‍රතිසංස්කරණය කිරීම | වා.ඉ. /ඉ.ස | ස්ථානීය පරීක්ෂණයකින් අනතුරුව |
| එම | ප්‍රධාන ඇළෙහි ජලජ පැළෑට් නිසා ජලය නිසි පරිදි ගලා නොයාම | ජලජ පැළෑට ඉවත් කිරීම | වා.ඉ. /ඉ.ස | ඉදිරි කන්නය ආරම්භ වීමට පෙර |
| ඩී 02 ගරු ලේකම් | ප්‍රධාන ඇළෙහි ජලජ පැළෑට් හා රොන් මඩ පිරීම නිසා ජලය නිසි පරිදි ගලා නොයාම | ජලජ පැළෑට හා රොන් මඩ ඉවත් කිරීම | වා.ඉ. /ඉ.ස | ඉදිරි කන්නය ආරම්භ වීමට පෙර |

<u>03.1. කෘෂිකර්මික කටයුතු (කෘෂිකර්ම උපදේශක - උස්ගල සියඹලන්ගමුව)</u>

අද දින සිට අස්වනු සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීම සිදු වන අතර හදුනාගත් එක් ප්‍රබල බලපෑමක් වන්නේ දුඹුරු පැළ කීඩෑ හානිය යි දැනට ස්ථාන කිහිපයකින් මෙම තත්වය වාර්තා වූවා සේම හදුනාගත් අතර වගා කටයුතු නියමිත දින වකවානු වලදී ආරම්භ නොකිරීම ද මෙයට එක් හේතුවක් බව පෙන්වා දුණි. පවතින එකම පිළියම වන්නේ ජලය ඉතා අවම මට්ටමින් වගාවට නිකුත් කිරීම බවද පැහැදිලි කර දුණි.

ඉදිරි යල කන්නය සඳහා බිත්තර වී අවශ්‍යතාවය සපුරා ගැනීමට ඉතා ඉක්මණින් කටයුතු කළ යුතු අතර ගුණාත්මක බිත්තර වී ලබා දීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද දායකත්වය ලබා දෙනු ලැබේ.

දැනට අස්වනු නෙළීමේ කටයුතු ආරම්භ වී තිබෙන නිසා මාර්තු 20 දින ජලය නිකුත් කිරීම සුදුසු බවට කෘෂිකර්ම උපදේශක මහතා යෝජනාවක් කළ අතර එසේ වුවහොත් අතරමැදි කන්නයක් සඳහා ද යා හැකි බව අවධාරණය කරන ලදි.

<u>05.සැපයුම් හා සේවා(ගොවිජන සේවා දෙපාර්තමේන්තුව )</u>

- නියෝජනයක් සිදු නොවුණි

<u>2018/19 මහ කන්නය සඳහා පෙර වගා තීරණ</u>

<u>ඩී 03 ගොවි සංවිධානයේ ගරු සභාපති</u> - තව දුරටත් කුඹුරු 03 ක වී පමණකවගාවට ජල අවශ්‍යතාවය පවතින අතර ඉදිරි මාර්තු 20 දින යල ක්නනය සඳහා ජලය නිකුත් කරන ලෙස ගොවීන් ඉල්ලා සිටන බව පවසන ලදි.

<u>යාය 05 ගොවි සංවිධානයේ ගරු ලේකම්</u> - ගොවීන්ගේ ඉල්ලීම වන්නේ යල් කන්නය සඳහා මාර්තු 16 ජලය නිකුත් කරන ලෙසත් සියලුම ගොවීන් එකවර වගා කටයුතු සඳහා යොමු වීම මගින් ගැටලු රැසක් අවම කර ගත හැකි බවත් ය.ඉන් අනතුරුව තුන්වන කන්නය සඳහා සූදානම් වීමටද හැකියාව පවතින බව ප්‍රකාශ කරන ලදි.

කන්න රැස්වීම් වාර්තා මින් ඉදිරියට ගැසට නිවේදන අයුරින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන ලෙසත් ඉදිරි යල කන්නය අවසන් වූ වහාම PEISEIP ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

සාලියරාජ ගොවි සංවිධානයේ ගරු සභාපති - වගා කටයුතු සියල්ලම අවසන් වන තෙක් සිටිම තුළින් කන්නය ප්‍රමාද වීමක් සිදු වන නිසා නියමිත වේලාවට නියමිත දිනට ජලය නිකුත් කිරීම කළ යුතු බව දැන්වී ය.

නේවාසික ව්‍යාපෘති කළමනාකරු - කන්න රැස්වීම් ගැසට් නිවේදන හරහා ප්‍රසිද්ධ කිරීමේ කටයුතු දිස්ත්‍රික් ලේකම් වරයා විසින් සිදු කළ යුතු එකක් නිසා මෙම අදහස ඉදිරි කෘෂිකර්ම කමිටුවේදී දිස්ත්‍රික් ලේකම් තුමා වෙත දැනුම් දෙන ලෙස ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති වරයා හට උපදෙස් දුනි.

ඒ අනුව ව්‍යාපාර කමටුවෙහි සියලු දෙනාගේ තීරණ මත 1994 අංක 13 දරණ සංශෝධන පණතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය යටතේ උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය වෙනුවෙන් 2019 යල කන්නය සඳහා පහත පරිදි වගා කාල සටහන සකස් කර ගන්නා ලදි.

| අනු අංකය | විස්තරය | උස්ගල සියඹලන්ගමුව |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය | වී මාස 3 / මාස 3 1/2 |
| 02 | වගා කිරීමට අපේක්ෂිත බිම් ප්‍රමාණය | අක්: 2200 |
| 03 | ගොවින් විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | 2019.03.10 දින ට පෙර |
| 04 | ගොවින් විසින් නියමිත දිනට නඩත්තු නොකරනු ලැබූ ඇලවල් ගොවි සංවිධාන විසින් නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | 2019.03.15 දින ට පෙර |
| 05 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවිසංවිධාන විසින් ප්‍රධාන ඇලවල්/බෙදුම් ඇලවල් නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | 2019.03.15 දින ට පෙර |
| 06 | කිරි ඉතිරවීමෙ මංගල්‍යය පැවැත්වීම | 2019.03.16 |
| 07 | මුල් වරට ජලය නිකතු කිරීමට යොජිත දිනය | 2019.03.16 |
| 08 | වපුරා/බීජ සිටුවා අවසන් කල යුතු දිනය | 2019.04.12 |
| 09 | මුර ජලය ආරම්භ කරන දිනය | 2019.04.25 |
| 10 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2019.07.10 |
| 11 | ගවයින් යායෙන් ඉවත් කල යුතු දිනය | 2019.04.10 |
| 12 | වගා රක්ෂණය කර අවසන් කල යුතු දිනය | 2019.04.10 |
| 13 | වගා හානි දැණුම් දිය යුතු අවසන් දිනය | 2019.07.10 |
| 14 | අස්වනු නෙලා අවසන් කලයුතු දිනය | 2019.07.30 |

- 1994 අංක13 දරන වාරිමාර්ග ( සංශෝධන ) පණතේ 11 වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සදහා යෝජිත වගා රීති

- කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල්වල නඩත්තුව සදහා කන්නයකට අක්කර 01 සදහා රු.300.00 ක මුදලක් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.

- නියමිත දිනට කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල්වල තම කොටස නඩත්තු නොකරන අය ගෙන් මීටරයකට රු.150.00 ක මුදලක් ගොවිසංවිධානයට අය කළ හැකිය.

- පිදුරු ගිණි තැබම සමපුරණයෙන්ම තහනම් වෙ අක්කරයක පිදුරු ගිණි තැබමක් සිදු කළහොත් එම තැනැත්තා රු 2000.00 ක දඩ මුදලක් ගොව සංවිධානයට ගෙවය යුතු අතර ඒ හා සමාන කාබනික පොහොර ප්‍රමාණයක් කුඹුරුට යෙදිය යුතුය.අදාල කෘ ප නි ස වරයා විසින් ඒ පිළිබද වාරතාවක් සැපයිය යුතු අතර එම වාරතාව ගොවජන සංවරධන නිලධාරීවරයාගේ නිරදේශයක් සහිතව ගොව සංවධානයට ලබා දිය යුතුවේ

- ගවයින් නිදැල්ලේ යැවීම සමපූරණයෙන්ම තහනම වන අතර වගා හානියක් සිදු වුවහොත් ගොවජන සංවරධන පණතට අනුව කටයුතු කළ යුතු අතර වාරි පද්ධතියට හානි සිදු වුවහොත් වාරිමාරග සංශෝධණ පණතට අනුව කටයුතු කළ යුතුය

- වගා රැස්වීමේ තීරණ වලට පටහැනිව ජලය ලබා ගැනීම හා වාරි නිරමිත වලට හානි කිරීම සිදු කළහොත් වාරිමාරග පණතට අනුව දඩ අය කිරීමට ගොව සංවධාන වලට බලය ලබාදිය යුතුය.අනවසරයෙන් ජලය ලබා ගැනීම වරදක් වන අතර කෙත් ඇළ නියෝජිතවරුන්ගේ අනු දැනුමකින්

- තොරව ජලය ලබා ගැනීම වෙනුවෙන් ගොව සංවධානය තීරණය කරන දඩ මුදලක් ලබා ගැනීමේ බලය ගොව සංවධානය සතු වේ.අවශ්‍ය අවස්ථා වලදී තක්සේරු කිරීම වාරිමාරග දෙපාරතමේන්තුවට පැවරේ.එසේම අනවසරයෙන් . බලහත්කාරයෙන් හෝ පොම්ප භාවිතයෙන් ජලය ලබා ගෙන රක්ෂිත .ගොඩ ඉඩම හෝ අනවසර ඉඩම වගා කිරීම තහනම වේ.

ඒ අනුව 2019 යල කන්නය සදහා වු පෙර කන්න රැස්වීමේ දී ගනු ලැබූ ඉහත තීරණ ඉතා සුදුසු බවට යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති එස් පී තිලකරත්න මහතා කළ යෝජනාව ඩී 02 ගොවි සංවිධානයේ ගරු ලේකම් ඒ එච් ආරියරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

<u>06.විශේෂ ( ගොවි සංවිධාන / වෙනත් )</u>

<u>යාය 05 ගොවි සංවිධානයේ ගරු උප සභාපති</u> - සෑම කන්නයකම පාහේ ගොවින් අසීරුතාවට ලක් වන කරුණක් වන්නේ බිත්තර වී අවශ්‍යතාවය සපුරාගැනීම යි. මෙම ගැටලුව සඳහා විසඳුමක් ලෙස ව්‍යාපාරයේ ගොවීන්ට අවශ්‍ය බිත්තර වී ව්‍යාපාරය තුළින්ම නිශ්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතු බව දැන්වී ය. මේ සඳහා උස්ගල සියඹලන්ගමුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ පූරණ සහය ඉල්ලා සිටින ලදි.

උස්ගල සියඹලන්ගමුව ජලාශය ප්‍රධාන ඇළ . ඩී ඇළ . කෙත් ඇළවල් ඇතුලු වාරි පද්ධතිය ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම ආදී කටයුතු මේ වන තෙක් ගොවි සංවිධාන මගින් සිදු කරගෙන ආ නමුත් ජලාශයේ මත්ස්‍ය සම්පත පරිභෝජනය කිරීමට ඔවුන් හට අවස්ථාවක් නොමැත.

මෙම කරුණු වලින් අනතුරුව නේවාසික ව්‍යාපෘති කළමනාකරු ප්‍රකාශ කළේ වෙනත් ව්‍යාපාර වලද මෙම ධීවර කටයුතු කටයුතු සිදු වන ආකාරය පරීක්ෂා කර බලා ඒ සඳහා තීරණයක් දීමට සිදුවන බවයි.

<u>සාලියරාජ ගොවි සංවිධානයේ ගරු සභාපති</u> - ජලාශය මූලික කරගත් කෘෂිකර්මික කටයුතු වලදී ගොවීන් විසින් නඩත්තු මුදල් . අක්කර බදු වැනි අයකිරීම් ගෙවන නමුත් ධීවර සංවිධාන වල පිරිස් මෙම කිසිදු මුදලක් නොගෙවන බව දැන්වී ය. නමුත් මත්ස්‍ය සම්පත පරිභෝජනයේ දී ගොවීන් හට කිසිදු සහනදායී පිළිවෙතක් නොමැති බව කමිටුවට දැන්වී ය.

<u>උස්ගල මිරිදිය ධීවර සංවිධානයේ ගරු සභාපති</u>- මින් පෙර අවස්ථාවන් වලදී මෙවැනි රැසවීම් නියෝජනය කිරීමට තමාට නොහැකි වූ නිසා මෙම ගැටලු පිළිබඳව අවබෝධයක් නොමැති බව දැන්විය. නමුත් ඉදිරියේදී මෙවන් කමිටු නියෝජනය කරමින් මෙම කටයුතු සඳහා සහය ලබා දීමට කටයුතු කරන බව ව්‍යාපාර කමිටුව හමුවේ ප්‍රකාශ කරන ලදි.

එසේම මිරිදිය ධීවර කටයුතු ගුණාත්මකව හා නියමිත තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා වැවු තාවුල්ල මත කුඩා ප්‍රමාණයේ පොකුණු 02 ක් සකස් කර ගැනීමට ව්‍යාපාර කමිටුවේ අවසරය / අනුමැතිය ඉල්ලා සිටින ලදි.

ඒ අනුව වාරිමාර්ග ඉංජිනේරු තුමා ප්‍රකාශ කළේ ව්‍යාපාර කමිටුව හරහා පමණක් මෙම අවසරය / අනුමැතිය ලබා දීමට හැකියාව නොමැති නිසා ඉහළ ආයතන වෙතින් ද මෙම ඉල්ලීම කළ යුතු බවයි.

<u>ඩී 02 ගරු ලේකම් -</u> ව්‍යාපාරයේ වී අස්වැන්න මිළට ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු බව දැන්වූ අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් පිළිබඳව සැලකිළිමත් වී එම පහසුකම් ලබා ගැනීමට කටයුතු කරන ලෙස කමිටුවේ රාජ්‍ය ආයතන වලට දැන්වී ය.

## <u>07.ප්‍රාදේශිය ලේකම් - ගල්ගමුව</u>

රාජ්‍ය අංශය හරහා වී මිළට ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ වී ඇති අතර අදාල ප්‍රමිතීන් වලට අනුව පවතින නාඩු කි. ග්‍රැ. 01 ක් රු. 38.00 කට ද සම්බා කි. ග්‍රැ. 01 ක් රු. 41.00 කට ද මිළට ගැනීමට තීරණය වී ඇති බවයි. තෙතමනය 14% ක් පමණ පවතින වී කි. ග්‍රැ. 2000 ක් එක් ගොවියෙකුගෙන් මිළට ගන්නා බව ද දැන්වී ය.

අතිගරු ජනාධිපති තුමාගේ පරිසර වැඩසටහන අනුව මේ වන විට නව වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇති. එයට සමගාමීව ප්‍රදේශයේ ජලාශ පාදක කරගෙන රුක් රෝපණ වැඩසටහන් ඇරඹිය යුතු අතර මේ සඳහා උස්ගල ව්‍යාපාරය වෙනුවෙන් ද වැඩසටහනක් සකස් කර ඇත. ඒ අනුව ඉදිරි මාර්තු 22 දින උස්ගල ජලාශයේ රක්ෂිත හා තාවුල්ල ප්‍රදේශය මූලික කරගෙන කුඹුක් හා මී ගස් 4000 ක් රෝපණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මේ සඳහා සියලුම රාජ්‍ය ආයතන හා ගොවි නායකයින් හට සේම සියලුම ගොවීන්ට ද ආරාධනා කළාය.

ඩී 03 ගොවි සංවිධානයේ ගරු ලේකම් ප්‍රකාශ කළේ තම ගම් ප්‍රදේශය සඳහා අනුයුක්ත කර සිටින රාජ්‍ය නිලධාරීන් හට රාජකාරි ඉටු කිරීමට නිශ්චිත ස්ථානයක් නොමැති නිසා අසීරුතා රැසක් උද්ගත වී ඇති බවයි. මේ නිසා ඔවුන් සියලුම දෙනාටම එකම ස්ථානයක රාජකාරි කිරීම සඳහා සේවා පියසක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ප්‍රදේශිය ලේකම් තුමියගෙන් ඉල්ලා සිටින ලදි.

එපමණක් නොව ප්‍රදේශයේ වී අස්වැන්න අළෙවි කර ගැනීම සඳහා වී ගබඩාවක් ඉදි කිරීමට කටයුතු ආරම්භ කරන ලෙස ගල්ගමුව ප්‍රදේශිය ලේකම් තුමිය හට දැන්වූවා ය.

ප්‍රදේශිය ලේකම් තුමිය ප්‍රකාශ කළේ මෙවැනි කාර්යයන් සියල්ල හැකි ඉක්මණින් තමා වෙත ලිඛිතව දැනුම් දෙන ලෙසයි.

## <u>08.වාරිමාර්ග ඉංජිනේරු - ගල්ගමුව</u>

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිඛිත දැනුම් දීමක් පරිදි සමස්ථ ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි මහා වාරි ජලාශ මූලික කරගෙන සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායන වැඩසටහන් පැවැත්විය යුතුව ඇත. මේ නිසා උස්ගල ව්‍යාපාරයේ ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බැවින් ඒ පිළිබඳ සාකච්ජා කිරීමට ඒකාබද්ධ ගොවි සංවිධානය ප්‍රමුඛ ගොවි සංවිධාන වලට අවස්ථාව දුණි.

ඉන් අනතුරුව ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති ප්‍රකාශ කළේ මාර්තු 15 දින මෙම පිරිත් සජ්ඣායන වැඩසටහන පවත්වා 16 දින උදෑසන කිරි ඉතිරිමේ මංගල්‍යයෙන් අනතුරුව වගා කටයුතු සඳහා ජලය නිකුත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවයි.

## <u>09'වෙනත් ( නේවාසික ව්‍යාපාර කළමනාකරු)</u>

මිරිදිය ධීවර සංවිධානයේ නිලධාරීන් මෙම ව්‍යාපාර කමිටුව නියෝජනය කිරීම අගය කොට සැලකූ අතර ඉදිරියේ ඉතා සහයෝගයෙන් මෙම ගැටලු විසඳාගැනීමට කටයුතු කළ යුතු බව දැන්වී ය.

ගොවි සංවිධානයන්හි ඇළ පද්ධතිය නඩත්තු කිරීම සඳහා යන්ත්‍ර පද්ධතියක් ගොවි සංවිධාන සඳහා ගැනීමට කටයුතු කළ යුතු බව දැන්වූ අතර ඒ මගින් කාලය. ශ්‍රමය. මුදල්. ආදිය ඉතිරි වන අතර නියමිත තත්වයෙන් මෙම නඩත්තු කටයුතු සිදු කර ගත හැකි බව පෙන්වා දුණි.

ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ මහ සභා රැස්වීම පසුගිය දිනක දේවහුව ව්‍යාපාරයේදී පැවැත්වූ අතර එහිදී ස්ථාවර වී මිළක් පිළිබඳව සාකච්ඡා කළ බව ව්‍යාපාර කමිටුවට දැනුම් දුණි.

ඉදිරි කන්නය සැලසුම් කර ගැනීමට මෙතැන් පටන් ගොවීන් සූදානම් කරන ලෙස ගොවි නායකයින් හට දැනුම් දෙන ලදි'

ඉහත සඳහන් පරිදි සකස් කරගත් 2019 යල කන්නයේ වගා සැලැස්ම අනුව ව්‍යාපාරයේ ඉදිරි කටයුතු සඳහා සූදානම් වන ලෙස සියලු ආයතන වලින් ඉල්ලීම කරමින් අවසාන වශයෙන් 2019 යල කන්නයේ වගා රැස්වීම පිළිබඳ නිශ්චිත දිනය ඉදිරියේදී දැනුම් දෙන බව ද ප්‍රකාශ කරමින් සපැමිණි සියලු දෙනාට ද ස්තුතිය පුද කරමින් ප.ව. 01.00 ට පමණ පෙර කන්න රැස්වීම අවසන් කරන ලදි.

ඩී එම් කේ එච් දිසානායක

නේවාසික ව්‍යාපාර කළමනාකරු

මී-ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

ගල්ගමුව

පිටපත් -

01.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :-කාරුණික දැන ගැනීම සඳහා

02.දිස්ත්‍රික් ලේකම්/දිසාපති, කුරුණෑගල :-කාරුණික දැන ගැනීම සඳහා

03.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල :-කාරුණික දැන ගැනීම සඳහා

04.ප්‍රාදේශීය ලේකම්. ගල්ගමුව :-අ.ක.ස.

05.වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමුව :-අ.ක.ස.

06.ගොවිජන සං. නියෝජ්‍ය කොම.කුරුණෑගල :-අ.ක.ස.

07.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ අ/පුර (අන්තර් පළාත්) :-අ.ක.ස.

08.ගොවිජන සං. නිලධාරී ගල්ගමුව :-අ.ක.ස.

09.කෘෂිකර්ම උපදේශක උ/සියඹලන්ගමුව :-අ.ක.ස.

10.සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය.මහව :-අ.ක.ස.

11.පොල් සංවර්ධන නිලධාරී- ගො.සේ.ම.-ගල්ගමුව :-කාරුණික දැන ගැනීම සඳහා